**නිවේදනය "B"**

ගරු මන්ත්‍රීවරුනි, පසුගිය 2018 නොවැම්බර් මස 14 වැනි බදාදා, 15 වැනි බ්‍රහස්පතින්දා සහ 16 වැනි සිකුරාදා දිනයන්හි පාර්ලිමේන්තුවේ රැස්වීම් පැවැත්වෙන අවස්ථාවලදී සභා ගර්භය තුළ ඇති වූ බරපතල නොසන්සුන්කාරී තත්ත්වයන් නිසා අකමැත්තෙන් වුවද සියලු මන්ත්‍රීවරයන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම පිණිස පොලිසිය කැඳවීමට සිදුවූ බව දන්වනු කැමැත්තෙමි.

තවද, පාර්ලිමේන්තුවේ සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් විසින් සභා ගර්භය තුළ හෝ පාර්ලිමේන්තු සභාගර්භ ආලින්දයන් තුළ ආරක්ෂාව පිළිබඳව තහවුරුවක් මා හට ලබා දෙන්නේ නම් ඉතාමත් ඉක්මනින් සභා ගර්භයේ කටයුතු සම්බන්ධයෙන් අතිරේක ලෙස පොලිසියේ සහාය ලබා ගැනීම වහාම නැවැත්වීමට මා පියවර ගන්නා බවද මෙම සභාවට දන්වනු කැමැත්තෙමි.